# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1866/7 - 2014 ජුනි මස 10 වැනි අඟහරුවාදා - 2014.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LA/2073

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට හක්මන ජල සම්පාදන ක්‍රමය යටතේ ජල පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 ජුනි මස 04 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1042.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුපිල්ලේගොඩ ග්‍රාම නිලධාරී වසමේ උඩුපිල්ලේගොඩ ගමේ පිහිටි ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාර ඉඩම නැමති ඉඩම් කොටස පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල මහතා විසින් පිළියෙල කර ඇති අංක 3364 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 02 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | හක්මන සිට කරතොට දක්වා වූ ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | ඇළ. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. විහාරාධිපති,
ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරය,
උඩුපිල්ලේගොඩ,
හක්මන.

06 - 731

1A - G 19710 — 70 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*